# අනුරුද්ධ ශතකය - ශ්ලෝකාර්ථ නිරූපණය

කරගස්වැවේ විමලානන්ද හිමි

පොළොන්නරු යුගයේ වැඩ විසූ අනුරුද්ධ තෙරපාණන් විසින් රචනා කරන ලද කාව්‍ය ග්‍රන්ථයක් වූ අනුරුද්ධ ශතකය බොහෝ විද්වතුන්ගේ සම්භාවනාවට පාත්‍ර වූ කෘතියකි. මෙහි ඇතුළත් බුද්ධ වන්දනා, සූවිසි විවරණ, බෝසතුන්ගේ පාරමිතා පූරණය, තුෂිත දිව්‍යලෝකයෙන් චුතව කපිලවස්තු නගරයෙහි උප්පත්තිය, මාරපරාජය සහ බුද්ධත්ව ප්‍රාප්තියේ පටන් බුද්ධත්වයේ විශේෂතා ද ග්‍රන්ථයේ ඇතුළත් විෂය කරුණුයි. අදාළ විස්තර දැනට පළ වී ඇති අනුවාද සංස්කරණයන්ගෙන් කියවා දැනගත හැකියි. මෙහි සංස්කරණ අතර රණස්ගල්ලේ හිමියන්ගේ සන්නය ද, බටුවන්තුඩාවේ පඬිතුමාගේ සංස්කරණය ද, දෙහිගස්පේ ප්‍රඥාසාර හිමිපාණන්ගේ ඉංග්‍රීසි අනුවාදය ද වේ.

නමස්තස්මෛ භගවතෝර්හතෙ සම්‍යක්සම්බුද්ධාය
ඒ භගවත් වූ අර්හත් සම්‍යක් සම්බුදුන්ට නමස්කාර වේවා.

1. ලක්ෂ්මීසංවදනං හිමාංශුවදනං ධර්මාමෘතස්‍යන්දනම්
මන්ද්‍රාලාපකලං ගුණෛරවිලකං පාපද්විපෙ පාකලම්
සත්ත්වානාං නයනොද්ධවං මතිධ්වං මෛත්‍රීලතා මාධවම්
කාල්‍යානාපසතං රජොහතිසතං භක්ත්‍යා නමෙ ශ්‍රී ඝනම්

ලක්ෂ්මි සංවදනම් - සම්පති, ශෝභාව, සිරිකත, මන්ත්‍රාදියෙන් යුක්තව කැඳවන, සංවදති (පර. පද) සංවදතෙ (ආත්. පද) සං √වද් - කැඳවීම, සාකච්ඡා, කතාබස් කිරීම අර්ථයෙහි වැටේ.

හිමාංශු වදනම් - සිසිල් කිරණින් යුක්ත සඳ (හිමාලින් - සිසිල් කිරණින් වට වූ සඳ) වදනම් - මුහුණ, මුඛය (සඳවන් මුහුණ ඇති) මුහුණ ම සඳ වූ රූපකාලංකාරය.

ධර්මාමෘතස්‍යන්දනම් - ධර්මය නැමැති අමෘතය ගලා බසින, ධර්ම උණාදි ප්‍රත්‍ය ප්‍රයෝගයෙන් සාදා ගනු ලබන කෘදන්ත පදයකි. ධර්මඃ- දරන්නා හෝ දරනු ලබන්නා යන අර්ථයයි. √ධෘ + ම ප්‍රත්‍යය, ධි + අර් = ගුණවීමයි. = ධර්ම, සෘ + ම = සෘම - සර්ම, භා + ම = භාම - බැබළීම, යා + මඃ = යාමය යනාදිය උදාහරණයි. ස්‍යන්දම් = √ ප්‍රස්‍රවණෙ - ගලායාම් අර්ථයෙහි ස්‍යන්දතේ - ගලාබසී. ස්‍යන්දන -

ත්‍රෛකාලික කෘදන්තයකි. සාන්ද් +අන ප්‍රත්‍යයයි. උදා - සාධ් +අන = සාධන, වෘධ්+අන - වර්ධන, අමෘත කෘදන්ත, අවසාන ක්‍රියාවක් ලෙසින් ද යෙදේ. අ+මෘ+ත (ක්ත, ක්තවතු ප්‍රත්‍යය ප්‍රයෝග)
මන්ද්‍රාලාපකලං - ස්නිග්ධ ගම්භීර වචනයෙන් මනෝඥ වූ මන්ද්‍රෘ-ප්‍රීතිමත් සතුටින් යුත්, √මන්ද් - ස්තුති මොද මද
ස්වප්‍රකාන්තගතිෂු - තුති කිරීම, තුටු වීම, නිදා ගැනීම, තෙමෙම බැබළීම, ගමන, අර්ථයෙහි යෙදේ.
√මන්ද් + ර (උණාදි කෘත් ප්‍රත්‍යය - මන්ද්‍ර, උදා- √ඉද් + ර =ඉන්ද්‍ර - සතුටු කරන්නා, √චද් + ර = සතුටු කරන්නා, √ශක් + ර- ශක්‍ර - හැකි තැනැත්තා, √රුද් + ර - රුද්‍ර - හඬන්නා, ශිව දෙවියා,) ආලාප - මිහිරි නාදය, √ කල් - ශබ්ද සංඛ්‍යානයෝඃ - නාද කිරීම, ගණන් කිරීම අර්ථයන්හි ධාතුයි. කලතේ - ශබ්ද කරයි. ගණන් කරයි. ආලාප ආ + √ලප් - ව්‍යක්තායාම් වාචි - පැහැදිලි උච්චාරණ අර්ථයෙහි යෙසේ. පාපද්වීපයේ - පව නමැති එස්තියා කෙරහි අජීරණයක් වූ, පාකලම් - √පච - පාකේ - පිසීම් අර්ථයෙහි, පච් +(ක්) ල - පාකල අල් කාරයෙන් ධාතුවෙහි අර්ථය ප්‍රතිෂේධ කෙරෙයි. පාකල - නොපැසුණු - නොදිර වූ ජ්වරය යනු අර්තයයි. උණාදි ප්‍රත්‍ය කෘදන්ත සාධනය උදා, √වෘෂ් - වෘෂලඃ - ශුද්‍රයා, √සෘ - සරළ (උදාර, සෘජු)
(√විශ් - ප්‍රවේශනේ - පිවිසීම් අර්ථයෙහි, ප්‍රමාණ අර්ථයෙහි කෘත් කාල ප්‍රත්‍යය අ+ආල= විශාල, මහත්)
ගුණෛරවිකලං - දශ බල ආදි ගුණයන්ගෙන් පරිපූර්ණ වූ, ගුණෛඃ+අවිකලං - අ+වි+කල - අමනෝඥ නොවූ.
සත්වානං නයනෝධ්වම් - සත්ත්වයන්ගේ ඇසට උත්සවයක් වූ, උත්+භවම් - √හු - දානාදයෝඃ - දානාදි යාග විෂයයෙහි, යාග ගින්න, උත්සවය යන අර්ථයයි.
මහිද්වම් - ප්‍රඥා (වල්ලභ) ස්වාමි වූ, මහි =ප්‍රඥාව, ධවම් - ස්වාමියා, විධවා = ස්වාමියා නැති ස්ත්‍රිය, √ධූ ධාතුයි.
මෛත්‍රීලතාමාධවම් - මෛත්‍රී ලතාවට වසන්ත කාලය සමාන වූ, මාධවම් - වසන්ත සමය (අප්‍රේල් මැයි) භාව තද්ධිතයි.



කල්‍යාණාපසණම් - මනෝඥ වූ අංග ප්‍රත්‍යංග ඇති. කල්‍යාණ - මනෝඥ, අපසණ - අතපය ආදී අංග, අපසණ - වලාකුළු රහිත පැහැපත්, සණ - තද, ස්ථිර.
රජෝහතිසණම් - කෙළෙස් නැසීමට මේසයක් බඳු වූ, හති - √හන් - හිංසායාම් සංසාතේ - හිංසා - නැසීම අර්ථයේ. √හන්+ක්ති=හති - නැසීම - ස්ත්‍රී කෘදන්ත. උදා- √ගම්+ක්ති=ගති - ගමන, √කෘ+ක්ති - කෘති - කිරීම.
ශ්‍රී සනම් - බුදුරදුන්ට (ස්ථිර ශෝභා ඇති) භක්ත්‍යා නමේ - භක්තියෙන් වඳිමි. නමේ - √නම් - (ප්‍රහ්වත්‍යෙ ශබ්දේ ච) ගෞරව කිරීම, හඬ නැගීම් අර්ථයන්හි.

2. කෞතාජ්තාංසෝවිලයං (කෘත්වාඞ්සාවිලයං) ගුණෛකවිලයං
නිස්සඞ්ගධූතාලයං
ලෝකාතීතමහෝදයං බහුදයං සද්ධර්මභාණුදයං
ආභාස්වච්චරණං සමෘද්ධචරණං ප්‍රඥාවශාධොරණං
වන්දේ ජාතමහාබලං දශබලං සන්නද්ධමෛත්‍රීබලං
කෞතාජ්තාංසෝවිලයං - පාපයන්ගේ විනාශය කරන ලද, අංස=අඝ - අංඝ ශබ්දය ව්‍යවහාරයේ වරලය. අඝ යනු පාපයයි. ලිංගත්‍රයේ ම යෙදේ. අංසාරි යනු පවට සතුරු යනුයි.
ගුණෛකවිලයං - ගුණයන්ට එකම වාසස්ථානය වූ, නිලය - ගෘහය, කුරුළු කැදැල්ල, නි +√ලී - ශ්ලේෂනේ - ඇලීම, වැතිරීම යන අර්ථයයි. ලීයතේ - පදිංචි වෙයි. වාසය කරයි.
නිස්සඞ්ගධූතාලයං - නිරභිලාෂී (ඇලීම් නැති) දුරු කරන ලද ගෘහ ඇති නිස්සඞ්ග - සංගමයක් හෝ ඇලීමක් නැති. ධූත - ධූ කම්පනේ - කැළඹීම් අර්ථයේ, නිෂ්ඨා කෘදන්තයි. √කෘ+ක්ත - කෘත, √දා+ක්ත - දෙන ලද, ආලයං - ආ+√ලී (ශ්ලේෂනේ) ඇලීම් අර්ථ ධාතුවෙන් උපන් කෘදන්තයි. හිමාලය - හිම පවත්නා ස්ථානයයි.

ලෝකාතීතමහෝදයං - සියලු සත්වයන් වෙත පමුණුවන ලද මහත් වෘද්ධිය ඇති. ආ+√නීත - නිෂ්ඨා කෘදන්තයි. මහෝදයං - විශේෂණ පූර්ව කර්මධාරය සමාසයි. මහත් අභිවෘද්ධිය ඇති අර්ථ ද වේ.
බහුදයං - දයා බහුල වූ, විශේෂණ පූර්ව කර්මධාරය සමාසයි. උදා. මහාමුනිඃ, කෘෂ්ණසර්පඃ යනාදියයි.

සද්ධර්මභාණුදයං සද්ධර්ම නමැති සූර්යයාගේ පහළ වීම ඇති, භාණෝඃ උදයම්භාණුදයං - ෂෂ්ඨී තත්පුරුෂයි. උදා- රාජපුත්‍රඃ, දේවලෝකඃ

ආභාස්වච්චරණං - බබළන්නා වූ ශ්‍රී පාද ඇති, ආභස්වත් යනු අස්ථ්‍යාර්ථ තද්ධිතයි. බැබළීමෙන් යුක්ත යන අර්ථයයි. චරණං - චර්- ගතෞ - ගමනාර්ථ ධාතුයි. √චර්+අන - ප්‍රත්‍ය යෝගයෙන් සෑදෙන තෛකාලික කෘදන්තයි. උදා - √රම්+අන - රමණ, √නම්+අන - නන්දන.

සමෘද්ධචරණං - සමෘද්ධිමත් වූ පසළොස් චරණ ගුණ යුක්ත, සමෘද්ධ - සං+√භෘද්- වෘද්ධෞ- වෘද්ධි අර්ථයේ යෙදෙන නිෂ්ඨා කෘදන්තයි. චරණං- පසළොස් චරණ ධර්ම ඇති-

සීලං වරං ඉන්ද්‍රියංසවරෝ ච මත්තාසිතාජාගරියානුයෝගෝ
සද්ධාහිරෝත්තප්පබහුස්සුතං ච පරක්කමෝචෙව සතීමතී ච
චත්තාරිඣාණානි ච තානිමානි තිපඤ්චධම්මා චරණාතිජඤ්ඤා

ප්‍රඥාවශාධොරණං - අනාවරණ ඥාන නමැති හස්තිනියට හස්ති පාලකයෙක් වැනි වූ, වශා - කීකරු වසඟයට පත් හස්තිනිය, වශයති, බලෙන් කැමැති කරවා ගනී. ආධොරණං - ඇතුන් පාලනය කරන්න, √ධෘශ් (ප්‍රහසනේ) නින්දා කිරීමෙහි, යටපත් කිරීමේ යෙදේ.

ජාතමහාබලං -හටගත් මහත් කාය බල ඇති, ජාත - නිෂ්ඨා කෘදන්ත √ජන්.

මහබලං - කර්මධාරය සමාසයි.

සන්නද්ධමෛත්‍රීබලං - සැදුණා වූ මෛත්‍රී නමැති සේනාව ඇති, දශබලං - දස තථාගත බලයෙන් යුක්ත බුදුරදුන්ට වන්දේ - වඳිමි.

දශ තථාගත බල නම්

1. ඨානඤ්ච ඨානතෝ අට්ඨානඤ්ච අට්ඨානතෝ යථාභූතං පජානාති.
2. අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසෝ හේතුසෝ විපාකං යථාභූතං පජානාති.
3. සබ්බත්ථගාමිනී පටිපදං යථාභූතං පජානති.
4. අනේකධාතු නානාධාතු ලෝකං යථාභූතං පජානති.
5. සත්තානං නානාධිමුක්තිතං යථාභූතං පජානති.



6. පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රයපරෝපරියත්ත යථාභූතං පජානති.
7. ඣානවිමෝකඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වෝදානං වුට්ඨානං යථාභූතං පජානති.
8. අනෙකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති.
9. දිබ්බේනචක්ඛුනාවිසුද්ධේන අතිකනිමානුසකෙන සත්තේ පස්සති චවමනේ උප්පජ්ජමානේ හීනේපණීතේ ...... යථාකම්මූපගෙ සත්තේ පජානති.
10. ආසවනං ඛයා අනාසවං චෙතෝවිමුත්තිං..... සච්චිකත්වා උපසම්පජ්ජ ජවිහරති. (අං.නි. 10.21. සීහනාද සුත්ත)

3. ලොකාලංකාරණං විශුද්ධකරණං තීර්ථාබ්ජිනි වාරණං
සන්තාපච්ඡිදුරං සමස්තවිදූරං ලොකත්‍රයී මෙදූරම්
ශ්‍රද්ධාශීලධනං කෘතාන්තනිධනං සන්දග්ධ පාපෙන්ධනං
තං ශුද්ධොදන නන්දනං සුවදනං වන්දෙ ජගන්නන්දනම්

ලොක අලංකරණං - තුන් ලෝකයට ආභරණයටක් වූ ලොක - කාම රූප අරූප වශයෙන් ත්‍රිවිධ වේ. කාම- ඉන්ද්‍රියබද්ධ ලෝකය. රූප-4 රූප ධ්‍යාන සම්බන්ධ ලෝකය, අරූප - 4 අරූප ධ්‍යාන සම්බන්ධ ලෝකය.

විශුද්ධකරණං - නිර්මල වූ ශරීර ඇති. විශුද්ධ කරණම්කරණත්‍රාණ යනු හිස ආදී ඉන්ද්‍රිය අවයව රක්ෂණයයි. කරණ නියම යනු ඉන්ද්‍රිය සංවරයයි. කරණාධිප යනු ජීවමාන ආත්මයයි. √කෘ+අන +කරණ - කරන්න තෛකාලික කෘදන්ත උදා-√ර+අන - රාවණ හඬන්නා.

තීර්ථ අබ්ජානි වාරණම් - තීර්ථක නමැති පියුම් සමූහයට හස්තියෙකු වනි වූ අබ්ජානි - අසජනලයෙහි හටගත් - අබ්ජිනීපති - සූර්යයායි.

සන්තාපච්ඡිසුරම් - සියලු සත්වයන්ගේ ක්ලේශ සන්තාප දුරුකරන්නා වූ. සන්තාප - √තප් - සන්තාපෙ බැබලීම්, රත්වීම් අර්ථයන්හි යෙදේ.

ඡිදුරං - √ඡිද් - ද්වෛධීකරණෙ - කැපීම්, සිඳදැමීම් අර්ථයන්හි යෙදේ.

ඡිදුර - √ඡිද්-කුර ප්‍රත්‍යය ඡිදුරඃ සිඳින සුළු තැනැත්තේයි. ශීලාර්ථ කෘදන්ත පදයි.

සමස්තවිදූරම් - සියල්ල දන්නා සුලු වූ. සමස්ත - සං+√අප් - ක්ෂේපණේ - විසිකිරීම්, එකට තැබීම්, එක්කිරීම අර්ථයන්හි යෙදේ. සියල්ල යනුයි. ලිංගත්‍රයෙහි වරනැගේ. විදූරම් - √විද් - ඥානේ - දැන ගැනීම් අර්ථයෙහි √විද්+කුර ශීලාර්ථ කෘදන්ත ප්‍රත්‍යයයි. ලෝකත්‍රයීමේදුරම් - තුන් ලෝකයට ස්නිග්ධ වූ (ස්නේහී වූ) මේදුරම් - √මිද් - ස්නේහනේ - ස්නේහ කිරීම්, තෙත් කිරීම් අර්ථයන්හි √මිද්+කුර ශීලාර්ථ කෘදන්ත ප්‍රත්‍යයයි.

ශ්‍රද්ධාශීලධනම් - ශ්‍රද්ධාශීල නමැති ධන ඇති. ශ්‍රද්+ධා - ආප් ස්ත්‍රී කෘදන්ත ඇදහීම්, උදා - √ලිඛ් - ලේඛා, √මෘජ්+ආප් - මෘජා - පිරිසිදු කිරීම, √ඉෂ් - ඉච්ඡා

කෘතාන්තනිධනම් - මාරයාට විනාශ කර වූ කෘතාන්ත - මාරයාට නමකි. ක්‍රියා අන්තය, ඉරණම, මරණය, යම දෙවි යන අර්ථ දේ. කෘත නගරී යනු යම පුරයයි. නිධනම් - අන්තය, විච්ඡේදය, මරණය, පරාජයට පත් කිරීම නිධන ක්‍රියා යනු භූමදානයයි.

සන්දග්ධපාපෙන්ධනම් - දවන ලද පාප නමැති දර ඇති. සන්දග්ධ - සං+√දහ්භෂ්මීකරණේ → √දහ්+ත → දහ්ධ දග්ධ (ධ ආදේශයයි) නිෂ්ඨා කෘදන්තයයි → උදා. √ලභ්+ත ලබ්ධ, √ලුභ්+ත ලුබ්ධ යනුයි. පාපේන්ධනම් - √ඉන්ධි - දිප්‍යතේ - දිලෙන, බබලන, අර්ථයෙහි යෙදේ. √ඉන්ධි+අන = ඉන්ධන - භාව කෘදන්තයි. උදා- කරණම්, දානම් ආදියයි.

සුවදනම් - මනෝඥ වූ මුහුණ ඇති.

ජගන්නන්දනම් - ලෝකයා සතුටු කරවන. ශුද්ධෝදන නන්දනම් තං වන්දේ - ශුද්ධෝදන රජුගේ පුත් වූ ඒ බුදුරදුන්ට වඳිමි. √නන්ද - සමෘද්ධෞ, සමෘද්ධි අර්ථයෙහි යෙදේ.

4. සිද්ධස්ශීකරේ කපීතනතරෞ දීපංකරඃ ශංකරඃ
ප්‍රොචෙයං සුධියං සුමේධසමෘෂිං ලොකොත්තමො ගෞතමඃ
ඒෂ්‍යතෙෂ්‍ය භවිෂ්‍යතීති හලවානශ්වත්ථබෝධිද්‍රුමේ
තෞ බුද්ධෞ භවතාං හිතාය භවතාං තෞචාපි බෝධිද්‍රුමෞ.



ශීකරේ කපීතනතරෞ සිද්ධඃ - සිසිල් වූ කපීතන ගස මුල සිද්ධියට පත් වූ (බුදු වූ).

ශීකර - වැසි ඉසින, සිසිලස, සිසිල් දිය, ශික්ත - සිසිල් දිය ඉසින ලද.

ශංකරඃ දීපංකරඃ - ශාන්තිකර වූ දීපංකර නම් බුදුරජාණන් වහන්සේ, ශංකර - සමෘද්ධිය ඇති කරන. සම්පත්දායක යන අර්ථයයි. සංගිත රාගයක් සඳහා යෙදෙන නාමයකි.

මනෝඥ වූ බුද්ධි ඇති යම් සුමේධ නම් මහ ඍෂිවරයෙකු සුධියං යං සුමේධසමාෂිං සුධී ශබ්ද ද්වි.ඒක.වච. ශොභනා ධී - සුධී - ප්‍රාදි පූර්ව කර්මධාරය සමාසයයි. උදා. ප්‍රධානඃ කුපුරුෂඃ. සුමේධසම් - සුමේධස් √මිථ් - මේධා හිංසායෙඃ - අවබෝධය, හංසනය අර්ථයන්හි යෙදේ. මේධ+අස් උණාදි කෘදන්ත ප්‍රත්‍යයයි. මේධසම්. සුමේධ - දීපංකර බුදුරදුන් දවස බෝධිසත්ත්වයන් වහන්සේයි. ඔහු අමරාවතියෙහි ධනවත් බමුණෙකි. ගිහිගෙය හැරපියා හිමාලයෙහි බලවත් තවුසෙක් වූයේය. දීපංකර බුදුරදුන් මෙම නගරයට වඩිද්දි මග සකස් කළේය. මග සකසා නිම කර ගත නොහැකි වූ බැවින් එහි වැතිරී බුදුරදුන්ට තම සිරුර මතින් වැඩම කරන්ට සැළැස්විය. එහිදී බුදු බව පැතීය. ඔහු ගෞතම නමින් අනාගතයේ බුදු වන බවට දීපංකර බුදුරදුන්ගෙන් විවරණ ලැබුණි.

ඒෂං - මේ තෙමේ.

අශ්වත්ථබෝධිද්‍රමේ - ඇසටු බෝධිය සමීයේ.

ගෞතමඃ ලෝකෝත්තමඃ භගවාන් භවිෂ්‍යතීති - ගෞතම නම් ලෝක ශ්‍රේෂ්ඨ බුදු වන්නේයැයි (ප්‍රකාශ කළේය.)

ප්‍රොචේ - කියන ලද්දේ, ප්‍ර+√වච්+එ = ලිට්. ආත්. පද.ප්‍ර.පු.ඒකව. උදා.චක්‍රෙ, පෙචෙ.

තෞ බුද්ධෞ - ඒ දිපංකර, ගෞතම බුදුවරු දෙදෙන.

තෞ චාපි බෝධිද්‍රමෞ - එකී කපීතන අශ්වත්ථ බෝධි වෘක්ෂයන් දෙදෙනා.

භවතාම් හිතාය, භවතාම් - ඔබලාගේ හිත පිණිස වෙත්වා. භවතාම් - හලන්ත පුල්ලිඞ්ග භවත් ශබ්දයි. ෂෂ්ඨී බහු. (අත්වන්ත) භවතාම් - √භූ - ලොට්. පර.පද. ද්වි.වච.

5. ශ්‍රී කල්‍යාණස්ඵුරණකරණශ්ශාලකල්‍යාණ බෝධෞ
කල්‍යාණාත්මාමුනිපරිවෘඪඃ සිද්ධකෞණ්ඩින්‍ය නාථං
හින්දන්තන්ධන්තමම්ව රවිර්මඞ්ගලො නාගබොධෞ
බුද්ධස්සිද්ධස්ස බලු සුමනඃ රේවතස්ශෝභිතශ්ච

ශ්‍රී කල්‍යාණ ස්ඵුරණ කරණඃ - ශෝභාමත් → හේමයක් සේ බබලන ශරීර ඇති ශ්‍රී සම්පත් ශෝභාව, √ශ්‍රී - පාකෙ - √ශ්‍රී+රී ශ්‍රීඃ - උණාදි කෘදන්තයි. උදා. අවිඃ - ඔසප් ස්ත්‍රිය. තරිඃ - නැව
ස්ඵුරණ - √ස්ඵූර් - ස්ඵූරණේ - වෙව්ලීම්, බැබලීම් අර්ථයයි. කරණ - √කෘ - කරණේ - කිරීම් අර්ථයි. √කෘ+අන= කරණ - කරන්නයි. ත්‍රෛකාලික කෘදන්තයි. √ඍණ් - දීප්තෞ.
කල්‍යාණ ආත්මා මුනි පරිවෘඪං - මනෝඥ වූ සිත් ඇති ස්වාමි වූ.
ආත්මා - √අන් - ප්‍රාණනේ - ශ්වාසය කිරීමෙහි. √අත් - සාතත්‍ය ගමනේ - නිතර ඇවිදීම් අර්ථයෙහියි. √වා - (සුළඟ) හැමීම අර්ථයෙහි යනුවෙන් ප්‍රභවයන් තුනක් දැක්වේ. ජීවිතයේ ප්‍රධාන වූ සවිඥානකත්වය අදහස් කෙරේ.
මුනිපරිවාඪඃ - පරි+√වෘධි - වෘද්ධෞ - වර්ධන ශ්‍රේෂ්ඨ අර්ථයෙහියි. √වෘධ්+ත- (ත ප්‍රත්‍යයට ට, ඨ හා ඪ ආදේශයයි). නිෂ්ඨා කෘදන්තයි. උදා. √වහ් වූඪ, √මුහ් මූඪ
ශාල කල්‍යාණ බෝධෞ සිද්ධ කෞණ්ඩින්‍ය නාථඃ - ශාල කල්‍යාණ බෝධි සමීපයෙහි බුද්ධත්වයට පත් කෞණ්ඩින්‍ය නම් බුද්ධ ද, ශාල - විශාල ශක්තිමත් ගස, සල්ගස.
ඍවිරිව අන්ධන්තමං හින්දන් නාගබෝධෞ සිද්ධඃ මංගලෝ බුද්ධඃ - සූර්යයා මෙන් අන්ධකාරය නසමින් නාගස සමීපයේ බුදු වූ මංගල බුද්ධ ද,

හින්දන් - √හින්ද් + ශතෘ ප්‍රත්‍යය - හින්දන්. උදා. වදන්, හසන්
ස බලු සුමනඃ රේවතඃ ශෝභිතඃ ච - ඒ සුමන නම් බුද්ධ ද, ශෝභිත නම් බුද්ධ ද.

6. මුනිරනවවමදර්ශී වාර්ජුනේ ශෝණබෝධෞ
ගතමතිරපි පද්මස්සාරදෝ නාරදශ්ච
අවිරල සරලද්‍රෞ බුද්ධපද්මෝත්තරාබ්‍යො
මුනිරපි නවනීපේ ලබ්ධමේධාස්සුමේධාඃ



අර්ජුනේ ගතමති අනවමදර්ශි මුනිශ්ච - කුඹුක් ගස සමීපයෙහි බුදු වූ අනෝමදස්සි මුනිවරයා ද, ශෝණබෝධෞ ගතිමතිඃ පද්මඃ ශෝණ බෝධියෙහි බුද්ධත්වයට පත් පදුම බුදුන් ද, සාරදඃ නාරදඃ ච, නිවන ලබා දෙන නාරද බුදුන් ද අවිරල සරල ද්‍රෞ බුද්දපද්මෝත්තරාබ්‍යො මුනිඃ - ඝන වූ සරල බෝධි මූලයෙහි බුදු වූ පදුමුත්තර නම් බුද්ධ ද, නවනීපේ ලබ්ධමේධානඃ සුමේධඃ - වනනීප ගස මුල ලැබූ ප්‍රඥා ඇති සුමේධ නම් බුද්ධ ද,

7. ස්ථූලප්‍රාංශු සදවංශුංහසවිධෙසිද්ධස්සුජාතො මුනිඃ
නිස්පන්නඃ ප්‍රියදර්ශී නාම සුගතස්තුංගප්‍රියංගුද්‍රැමෙ
සෞරබ්භෝද්බණ පුණ්‍යචම්පකතරෞ සිද්ධාර්ථදර්ශිවිභූර්
භාංගීචුම්බිතම්බජාල කලිත ශ්‍රී ධර්මදර්ශීමුනිඃ

ස්ථූලප්‍රාංශු සදංශුවංශසවිධෙ සිද්ධස්සුජාතඃ මුනිඃ - උස් මහත් වූ, මනා ශෝභා ඇති උණගස් සමීපයෙහි බුදු වූ සුජාත මුනිවරයා ද,
ස්ථූල - √ස්ථූල් - මහත් භාවයට පත්වීමෙහි, ප්‍ර +√අංශ් - ශරීරයේ බෙදීම් අර්ථයෙහියි. ප්‍රාංශු - උස් වූ ශරීරය.
සත් +අංශු - මනා උස් වූ ශරීරය (ශෝභාමත්)
වංශ - පුරුක් ඇති උණ, උක් වැනි ගස් (මූලය අඥානයයි)
ප්‍රාචීනවංශ - සන්ධිය, වංශ පරම්පරා රේඛාව.
සවිධෙ - ඒකාකාර, සමීප අර්ථයි. ලිංගත්‍රයේ යෙදේ.
තුංග ප්‍රියංගුද්‍රැමෙ නිෂ්පන්නඃ ප්‍රියදර්ශි නාම සුගතඃ උස් වූ පුවඟු රුක මුල බුදු වූ ප්‍රියදර්ශි නම් සුගතයන් ද, ද්‍රැම - √දෘ - වන්දනාර්ථයේ, වැගිරීම් යෙදේ. √දෘ + මන් - උණාදි කෘදන්තයි. ද්‍රැමඃ සෞරභ උද්භණ පුණ්‍ය චම්පක තරෞ සිද්ධ අර්ථදර්ශි විභූඃ - සුගන්ධයෙන් ස්ඵුට වූ පවිත්‍ර වූ සපුගස මුල බුදු වූ අත්තදස්සි නම් බුද්ධ ද, සෞරභ්‍ය - සු+√රභ් - රභසේ‍ය - ප්‍රීතියෙන් වැළඳ ගැනීම් ඇරඹීම අර්ථයෙහි යෙදේ.
සුරභි - සුවඳවත්, සෞරභ්‍ය - සුවඳවත් බව, භාව තද්ධිතයයි. උද්බණ - ගැඹුරු, විභූ - +√භූ - වර්ධනය, දියුණුව, පවිත්‍ර කිරීම් අර්ථයයි. √භූ - අවකල්පනේ. භෘංගිචුම්බිතම්බජාල කලිත ශ්‍රීඃ ධර්මදර්ශි මුනිඃ - බමරුන් විසින් සුඹුනා ලද රත්කරව් ගස මුල කරන ලද ධර්මරාජ ශ්‍රිය ඇති ධම්මදස්සි සුනීන්ද්‍ර ද, කලිත - √කල් - (ගතෞ සංඛ්‍යානේ ච) සැදීමෙහි, හැඩ ගැන්වීමෙහි අර්ථයි.

8. සිද්ධස්සිද්ධාර්ථනාමාමුනිරලසටයාඝූර්ඛිතෙ කර්ණිකාරෙ
තිෂ්‍යො විශ්වාර්ථවේදී ලසදසනතරෞ ධ්වස්තකාමඃ සකාමඃ
පුෂ්‍යන් පුෂ්‍යොපි විශ්වං සුධියමධිගතෝ නිර්මලාමාමලාඛ්‍යාං
පාටල්‍යාං පාටිතංසස්සඝෘණිරාධිගෘණො දීර්සදර්ශි විදර්ශි
අලිසටයා ඝූර්ණිතො කර්ණිකාරෙ සිද්ධඃ සිද්ධාර්ථ නාමා මුනිඃ - හමර සමූහයා විසින් බමණ ලද කිණිහිර ගස මුල බුදු වූ සිද්ධාර්ථ මුනිවරයා ද,

අලි - අලින් ශබ්දබමරා, අල=විත, අලිකුල, අලිමාලා, අලිසට - බිඟුන් සමූහය. ඝූර්ණිත - √ඝූර්ණ් - භ්‍රමණේ - නිෂ්ඨා කෘදන්තයි.

ලසත් අසන තරෞ ධ්වස්ථාසකඃ සකාමඃ විශ්වාර්ථවේදී තිෂ්‍යඃ බුද්ධඃ - බබලන්නා වූ පියාගස මුල නසන ලද තෘෂ්ණා ඇති කැමැති වන ලද බෝධි සංඛ්‍යාත අර්ථයෙන් යුක්ත වූ, සියලු අර්ථයන් දන්නා වූ තිස්ස නම් බුද්ධ ද, ලෙසත් - √ලංස් - ශ්ලේෂණක්‍රීඩනයෝඃ - වැළඳ ගැනීම්, බැබැළීම් අර්ථයන්හි යෙදේ. √ලංස් +අත් - (ශතෘ ප්‍රත්‍යය වර්තමාන කෘදන්තයි. උදාත පචත්, හසත්) ධ්වස්තකාමඃ - √ධ්වංස් - අවස්‍රසනේ ගතෞ ච - බිම වැටීම්, විනාශවීම් අර්ථයන්හිය.

ධ්වස්තකාමඃ - තුල්‍යාධිකරණ බහුව්‍රීහි සමාසයි. උදා. ඌඪරථඃ, බහුඵලඃ. විශ්වං පුෂ්‍යන් ආමලක්‍යාං නිර්මලානං සුධියං අධිගතඃ පුෂ්‍යොපි මුනිඃ- සියල්ල සපුරමින් ආමලකී බෝධි මූලයෙහි විශුද්ධ සම්බෝධියට පැමිණියා වූ ඵුස්ස නම් බුද්ධ ද,

පුෂ්‍යත් - √පුෂ් - පුෂ්ටෙි - පෝෂණ අර්ථයෙහිය. ආමලක්‍යාම් - ආමලකී ශබ්දය සප්. ඒක. නෙල්ලි ගස මුල.

පාටල්‍යාං පාටිතාංපාඃ සඝෘණිම් අධිඝෘණඃ දීර්සදර්ශී - පළොල් බෝධි මූලයෙහි නසන ලද පාප ඇති ශෝභා සහිත වූ , අධික වූ කරුණා ඇති, දීර්ඝ කාලාත්‍රය දර්ශී වූ විදර්ශී නම් බුද්ධ ද,

පාටයාලම් - පාටලී ශබ්දය සප්. ඒක. පළොල් ගස මුල. පාටිත අංසඃ - √පට් - අවසන් කිරීම් අර්ථයෙහි පාටක - බිඳින්නා, අංසඃ - අඝ, පාප. (අඝ ශබ්දය භාවිතයෙහි නොමැත.) එහෙත් අඝ ශබ්දය .......... සමානය. අඝ - පාපී, අපවිත්‍ර, අඝමර්ශන - සියලු පව් නසන අර්ථයයි. ත්‍රි ලිංගකයි. සඝෘණී - ඝෘණිවත් - බබළන, දිප්තිමත්. අධිඝෘණී - කරුණාන්විත බැල්ම කෘපාලු -කරුණා බහුල, √ඝෘණ් - දීප්තෞ.



9. සම්බුද්ධඃ පුණ්ඩරීකද්විරදමරගතිඃ පුණ්ඩරීකාෂලක්ෂ්මීඃ
චණ්ඩාංශෝ පුණ්ඩරීකං ඝෘණිසාරිව ශිඛි මණ්ඩිතඃ පුණ්ඩරීකේ
සිද්ධස්ශාලෙ විශාලෙ විජිතහෘදයභූ විශ්වභූශ්ච ස්වස්මභූර්
වෘක්ෂාධීශේ ශිරීපේ නිශිතධියමිතශ් ශ්‍රී ක්‍රකුත්ස්‍යන්දනාථඃ

පුණ්ඩරීකද්විරදමරගතිඃ - පුන්ඩරීක නම් ඇතාය බඳු ගමන් ඇති, පුණ්ඩරීකාක්ෂ ලක්ෂ්මීඃ - විස්ණුහට බඳු වූ ශෝභා ඇති,

පුණ්ඩරීක - අග්නිදිග දිශාවෙහි හස්තීන්, සුදු නෙළුම්,

ද්විරද - දෙදළ හස්තීන්, රද - ඇත් දළ රදනින්, රදින් යනු හස්තීන් සඳහා යෙදෙන නමය. ගතිඃ - √ගම්+ක්ති - ස්ත්‍රි කෘදන්ත ප්‍රත්‍යයි. ගතිඃ. උදා. කෘතිඃ, හතිඃ.

චන්ඩාංශොඃ - ඝෘණිභිඃ - සූර්යයාගේ ශෝභාවෙන්, පුණ්ඩරීකං ඉව - සුදු නෙළුමක් මෙන්, පුණ්ඩරීකේ - ඇටඹ ගස මුල.

මන්ඩිතඃ ශිඛි සම්බුද්ධඃ - හෙබියා වූ ශීඛි නම් බුද්ධ ද.

විශාලේ ශාලෙ සිද්ධඃ - විශාල සල් ගස මුල බුදු වූ,

විජිත හෘදයභූඃ විශ්වභූශ්ච ස්වයම්භූඃ - දිනන ලද අනංගයා ඇති වෙස්සභූ නම් බුද්ධ ද. හෘදය භූඃ - √හෘද්+භූඃ - අනංගයා. හදවත්හි වූ, වෘක්ෂාධීගේ ශිරීෂෙ - වෘක්ෂ ප්‍රධාන වූ මහරි රුක් මුල,

නිශිතධියමිතඃ ශ්‍රී ක්‍රකුත්ස්‍යාන්දනාථඃ - සම්බෝධියට පත් ශ්‍රී කකුසඳ නම් බුද්ධ ද, නිශිත - √නිශ් - සමොධෞ - සමාධි අර්ථයේ, තියුණු කිරීම් අර්ථයෙහිය. ධියමිතඃ - √ධී - භාවනා කිරීම් අර්ථයි. ධියම්පති - කල්පනයෙහි ස්වාමියි.

10. ලබ්ධශ්‍රීඃ කනකාගමො පි කුසුමෙස්සංචුම්බිතොදුම්බරස්
සම්බුද්දෝ කුටිලෙවටෙති වඨරෙ ගන්ධොත්කටෙ කාශ්‍යපඃ
ප්‍රාවුශ්චෛෂ භවිෂ්‍යතීතිභගවානශ්වත්ථබොධිද්‍රුමෙ
යං තෙ පාන්තු ජගන්ති වන්තකලුෂාස්තෙ චාපි බොධිද්‍රුමෙඃ

කුසුමෙඃ සංචුම්බිත උදුම්බරේ ලබ්ධ ශ්‍රීඃ කනකාගමො පි - පුෂ්පයෙන් සිඹින ලද දිවුල් ගස මුල තබන ලද ධර්මරාජ්‍ය ශ්‍රී ඇති කෝණාගම නම් බුද්ධ ද, සංචුම්බිත - සං+√චුම්බ් - වක්ත්‍ර සංයෝගේ - මුහුණ සිඹීම අර්ථයෙහි √චුම්බ්+ඉත - අතීත කෘදන්තයි. ලබ්ධ ශ්‍රීඃ - √ලභ්+ත(ධ) - ලබ්ධ - තුල්‍යාධිකරණ බහුව්‍රීහි සමාසයි. උදා. ඌඪරථඃ බහුඵලඃ

අකුටිලෙ අතිවය්රෙ ගත්ඨොත්කටෙ වටෙ සම්බුද්ධඃ කාශ්‍යපඃ - සෘජු වූ ඉතා මහත් වූ සුගන්දයෙන් මනෝඥ වූ නිග්‍රොධ මූලයෙහි සම්බුද්ධත්වයට පත් කාශ්‍යප බුද්ධ ද, අකුටිල - √කුටි - ඇද, වකුටු අර්ථයි. කුටිල = උණාදි කෘදන්තයි. අතිවය්රෙ - වය්ර මුග්ධ, මෝඩ, √වය් - මහත්, √වට් - ස්ථෞල්‍ය - ස්ථූල අර්ථයෙයි. √වය්+අර =වය්ර උණාදි කෘදන්තයි. උත්කට - ප්‍රමාණය ඉක්ම වූ, අග්‍රගණ්‍ය, වට වටකර ගත්, වෙළාගත් යන අරුත් ඇති නුග ගස, වටවාසී - නුග ගසට අරක් ගත් යකුන්,

එෂඃ අශ්වත්ථබෝධිද්‍රුමෙ භගවාන් භවිෂ්‍යතීති යං ප්‍රොචුඃ - මෙතෙමේ ඇසතු බෝ ගස මුල දී බුද්ධ වන්නේයැයි යමෙකු උදෙසා කීහු ද, භගවාන් - භාග්‍යය දරන්නා යනුයි. ආමන්ත්‍රණ අර්ථයේ යෙදේ. (√භා - දීප්තෞ බැබලීම් අර්ථයෙහි භවාන් යනුවෙන් උණාදි කෘදන්තය සෑදෙයි. භවත් ශබ්දයි. යුෂ්මත් අර්ථයි.) ප්‍රොදුඃ - ප්‍ර+√වච් - ලිට්. ප්‍රපු. බහු. - ප්‍ර+ඌචුඃ = ප්‍රොචුඃ = ප්‍රොචුඃ.

නන්ත කලුෂාඃ තෙ ච තෙ චාපි බොධිද්‍රුමාඃ ජගන්ති පාන්තු - නසන ලද පාප ඇති ඒ බුදුවරයෝ ද ඒ බෝධි වෘක්ෂයෝ ද සත්වයින් ආරක්ෂා කෙරෙත්වා. වාන්ත - √වම් - වදනය කිරීම් අර්ථයේ, √වම්+ක්ත - නිෂ්ඨා කෘදන්තයි. වාන්ත. උදා. පූර්ත, දන්ත.

කලුෂ - √කල් - අපවිත්‍ර, මඩ යන අරුත්. උණාදි ප්‍රත්‍යයි.

ජගන්ති - ජගත් (නපුං) ශබ්දයි. ද්වි. බහු. පාන්තු - √පා - රක්ෂණෙ - ආරක්ෂා කිරීම් අර්ථයි. ලෝට්. පරපද. බහු.

ආශ්‍රිත ග්‍රන්ථඃ


1. සන්න සහිත අනුරුද්ද ශතකය. රණස්ගල්ලේ ස්ථවිරයන් වහන්සේ, එස්. ගොඩගේ මුද්‍රණය, 2000, මරදාන පාර, කොළඹ 10.
2. Sanskrit Literature by Dr. Dehigaspe Pannasara. W.D. Hewavitane Espr. Kollupitiya, Colombo. 1958.
3. A Higher Sanskrit Grammar. M.R. Kale. Motilal Banarsidas, Delhi. Reprint 1992.